**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - 2018**

**----------------------------------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------------**

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යා ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයනාංශයට අනුයුක්තව පවත්වාගෙන යමින් තිබූ එම්.ඩී.(ආයුර්වේද)(2016/2019) වසර 3 ක පාඨමාලාවෙහි අධ්‍යයන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් පැනනැගිය හැකි අසම්භාව්‍ය තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මේ සම්බන්ධව නිශ්චිත තීරණයක් ගෙන නොතිබුණි. එබැවින් මෙම තත්ත්වය ඇති වී තිබෙන බව. | ප්‍රමිත ප්‍රකාරව අසම්භාව්‍ය තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | උපචිත පදනමට ගණනය කිරීමට ආයතනයට පැවති බාධාවන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලද රු. 395,300 ක් වූ නේවාසිකාගාර ගාස්තු ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කිරීම පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නේවාසික සිසුන්ගේ ඇති විචලතාවය අනුව උපචිත හා කලින් ලැබීම් නිශ්චය කල නොහැකි බැවින් මුදලින් ලැබීම් ගිණුම් තබන බව. | උපචිත පදනමට ආදායම ගිණුම්ගත කිරීම කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ එම්.ඩී.ආයුර්වේද පාඨමාලාව හැරගිය සිසුවකුගෙන් ලැබිය යුතු වූ ආදායම රු .211,111 ක් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. | පිළිගනිමි, අදාල පාඨමාලාව සම්බන්ධව නිශ්චිත තීරණයක් ගෙන නොතිබූ බැවින් මෙම තත්ත්වය ඇති වී තිබේ. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | බැහැර දෙන ලද පුස්තකාල පොත් ආපසු ගෙනවිත් භාරදීමට ප්‍රමාදවීම මත රු.10,803 ක දඩ මුදලක් ලැබීමට තිබූ නමුත් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පුස්තකාලය වෙතින් තොරතුරු නොලැබීම මත මෙම තත්ත්වය ඇති වී ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනිමට කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය අනුග්‍රහය මත පශ්චාත් උපාධි පුහුණුවක් සඳහා විදේශගත වු කථිකාචාර්යවරයෙකුගේ ගුවන් ටිකට්පත් ගාස්තු ලෙස 2012 වර්ෂයේ දී ආයතනයෙන් ගෙවන ලද රු79 , 000ක් 2018 වර්ෂය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | අදාල මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් සිටින බව | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශීය ප්‍රකාශකයන්ගෙන් ප්‍රකාශන මිලදී ගැනීමේදී සේවාව ලබාගැනීමට පෙර ආයතනය විසින් මුදල් ගෙවීම කරනු ලබන අතර එලෙස ප්‍රකාශන මිලදී ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වනවිට නිදහස් කර තිබූ මුදල රු 3,937,832.ක් වූ අතර ඒ තුළ වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා පැරණි ශේෂය රු.1,615,057 ක් විය. | විදේශීය සඟරා මිලදී ගැනිම සඳහා සඟරා මුද්‍රණ වර්ෂයට පෙර මුදල් ගෙවීම් සිදු කරනු ලබයි. එහෙත් සඟරා ලැබීම මුදල් ගෙවූ වර්ෂයට පසුව එලඹෙන වසරේදීම නොලැබෙන අතර ඊට පසු වර්ෂ වලදී ද ලැබෙන බව. | ප්‍රකාශන මිලදී ගැනීමේදී ගතවන කාලය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවට 2016 වර්ෂය වනවිට සායනික පර්යේෂණයක් සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදීමට අධිකාරී බලය නොමැති අතර එවැනි අවස්ථාවකදී අනුගාමී ආයතනයක ස්ථාපිත කර ඇති සායනික පර්යේෂණයක් සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදිය හැකි ආචාර ධර්ම කමිටුවක අනුමැතිය ලබාගත යුතු වුවද එලෙස සිදු නොකර දේශිය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාරධර්ම කමිටුවේ අනුමැතිය මත ආයුර්වේද ශික්ෂණ රෝහලෙහි රෝගීන්ට ඖෂධ ලබාදීම මගින් සායනික පරීක්ෂණයක් 2016 දෙසැම්බර් මස දී සිදු කර තිබුණි. මෙම පර්යේෂණය සිදු කරන ලද පර්යේෂකයින් 04 දෙනාගෙන් දෙදෙනෙකු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවේ සභාපති හා ලේකම් තනතුරු දරනු ලබන ලද කාලපරිච්ඡේදය තුළදී ඔවුන් දෙදෙනාද සහාභාගී වූ පර්යේෂණය සඳහා ආචාර ධර්ම කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබූ අතර ඉන් එක් කථිකාචාර්යවරයකු ඖෂධය නිෂ්පාදනය කරන සමාගමේ උපදේශකවරයකුද විය. | කලමනාකරණ මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුවක් විසින් මේ සම්බන්ධව විමර්ශණයක් සිදු කරගෙන යන බව. | සායනික පර්යේෂණයක් සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදිය හැකි ආචාර ධර්ම කමිටුවක අනුමැතිය ලබාගත යුතු අතර සම්බන්ධිත පාර්ශවයන් තීරණ ගැනීම සඳහා සහභාගී නොවිය යුතුය. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 104 | වත්කම් ප්‍රත්‍යාගණන අවස්ථාවේදී පිරිවැය රු.744,947 ක් වූ වත්කම්වල පැවැත්ම තහවුරු වී නොමැති බව හෙළිදරව් කරගෙන තිබුණද ආයතනය විසින් ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | භෞතිකව නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් වශයෙන් ලබාගත් මුදල් අදාළ කාර්යය අවසාන වූ වහාම පියවිය යුතු වුවත් අවස්ථා 10 කදී ලබාදී තිබූ මුළු මුදලම භාවිතා කිරීමකින් තොරව කාල ප්‍රමාදයක් සහිතව නැවත පියවීම්කර තිබුණි. | විවිධ හේතු මත අදාල කාර්යයන් කල් දැමීම මත ලබාගත් අත්තිකාරම් මුදල් මුළු මුදලම භාවිතයකින් තොරව ආපසු ලබා දී ඇත. ඉදිරියේ ප්‍රමාදයන්ගෙන් තොරව මුදල් ආපසු ගෙවීමට උපදෙස් ලබා දෙන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| මුදල් රෙගුලාසි 757(2) | වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව 2018 දෙසැම්බර් 31දිනට වත්කම් ඒකක 44 ක් බඩු වට්ටෝරු පොතේ ලේඛනගත කර නොතිබූ අතර වත්කම් ඒකක 96 ක් එදිනට ඌණව තිබුණි. | පරීක්ෂාකර බලා අවශ්‍ය පියවර ගනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.6 වගන්ති | යුනානි, ආයුර්වේද හා පශ්චාත් උපාධි අංශවල ආංශික කාර්යසාධනය පිළිබඳ කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | ආයුර්වේද හා යුනානි අංශයන්හි 2018 වර්ෂයට අදාල වාර්තා යැවීමට කටයුතු කරන අතර ඉදිරියේ දී නියමිත කාල පරාසය තුළ අදාල වාර්තා යැවීමට පියවර ගනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 3 වන උපලේඛනය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛයෙන් අපේක්ෂිත පරිදිම ඒවායේ වාර්තා තබා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම ගත යුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයෙහි සමුච්චිත ක්ෂයවීම් දැක්වෙන ආකාරයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණයේ ක්ෂය වීම් සඳහන්ව ඇත. එහි ඇති අඩුපාඩු සම්බන්ධව අදාල මෘදුකාංගය මිලදී ගත් ආයතනය සමඟ සාකච්ඡා කරමින් සිටියි. ඒ අනුව එම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| 2016 මාර්තු 31 දිනැති අංක 2016/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.1.6 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2019 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනයෙහි අංශ 6 කට අදාළව එම වාර්තා 2019 මැයි 10 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රමාදයන් අවම කර නියමිත කාලය තුල වත්කම් සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරිමට පියවර ගනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 25,724,695 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 23,668,975 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,055,720 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ලැබීම් රු. 75,319,000 කින් වැඩි වුවද විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු. 7,462,791 කින් වැඩි වීම හා පරිපාලන වියදම් හා අධ්‍යයන සේවා වියදම් පිළිවෙලින් රු.18,686,383 කින් හා රු. 47,546,295 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලය අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් ලබාදෙන ලද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකරන ලද මුදල රු.7,788,661 ක් විය. | උපයෝජනය නොකරන ලද මුදල වශයෙන් පෙන්වා ඇති මුදල් උපයෝජනය නොවී තිබුනේ ඇනවුම් කරන ලද භාණ්ඩ හා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්වලට අදාල බිල්පත් සඳහා ගෙවීම ප්‍රමාදවීම මතය. 2018.12.31 දිනට විවිධ ණයගැති වටිනාකම රු.12,363,611කි. කෙසේ වෙතත් ඉදිරියේ සියලු මුදල් අදාල වර්ෂය තුළ උපයෝජනය කිරීමට කටයුතු කරනු ලබන බව. | සැලැස්ම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් රු .16,910,425 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.15,208,945 ක් වැය කර තිබුණි. එම වියදමින් රු.9,471,101 ක් 2017 වර්ෂයට අදාළ ව්‍යාපෘති සඳහා වැය කර තිබුණි . | 2017 වර්ෂයේ ආරම්භ කර වැඩ නිම නොවූ කොන්ත්‍රත් සඳහා 2018 වර්ෂයේ වැඩ අවසන් වීමෙන් අනතුරුව අදාල මුදල් ගෙවා ඇති බව. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ ) ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද, ආයතනය ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) ඡේදයේ ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙල කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මෙහි ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාල වකවානු දක්වා තිබුණද ආයතනය තුළ සිදු කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී සැලැසුම් කරන ලද කාල වකවානු අනුව සිදුකර නොතිබුණි. | 2018 වර්ෂයේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාලවකවානු වැඩවර්ජන හා ශිෂ්‍ය ක්‍රියාමාර්ග වැනි ප්‍රායෝගික තත්ත්වය හමුවේ යම් තරමකට වෙනස් වී ඇත. කෙසේ වෙනත් 2019 වර්ෂයේදී අදාල කාලවකවානු වෙනස් වීම් අවම කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පසුගිය වර්ෂයට අදාළ ඉටු නොවී පවතින ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන සැලැස්ම තුළ අවිච්ඡින්න වැඩ ලෙස දක්වා නොතිබීම හේතුවෙන් අවිච්ඡින්න තත්ත්වය හා සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රසම්පාදනය තුළින් අපේක්ෂිත ඉලක්ක හා ලගාකර ගත් ප්‍රගතිය අඩු වීම. | 2018 වර්ෂයේ ඉටු නොවී පැවති ප්‍රසම්පාදන 2019 වර්ෂයේ පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ අවිනිශ්චිත ලෙස දක්වා ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිළියෙල කරමින් පවතින අතර ඉදිරියේදී විගණනය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළට අන්තර්ගත විය යුතු සංවිධාන ව්‍යුහය ,අනුමත කාර්ය මණ්ඩලය , දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳව ,වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛණය , ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | නිවැරදිව පිළියෙල කර ඇති බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙළ කිරීමේදී ඉලක්ක සහ දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟාවීම් මැන බැලීමට නොහැකි විය . | අඩුපාඩු අවම කරගෙන 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කරනු ලබන බව. | ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයුර්වේද හා යුනානි පාඨමාලාවල පසුගිය අධ්‍යයන වර්ෂ 6 ට අදාළ සිසුන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් සිසුන් 94 ක් හා සිසුන් 39 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. මෙය පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 15 ක අයහපත් වර්ධනයක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | පාඨමාලාව හැරයාම පිළිබඳව නිරන්තර සමාලෝචනයට ලක්කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | විභාග සඳහා පෙනී සිටි සිසුන්ගෙන් විභාග අසමත් වීමේ ප්‍රතිශතය, සිසුන්ගේ ජොෂ්ඨතාවය සමග වර්ධනය වී තිබුණු අතර 2010/2011 සිට 2016/2017 අධ්‍යයන වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 7 කට අදාල සිසුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ නියමිත විභාග වාර 25 ක් පවත්වා තිබූ අතර එම විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අසමත් වීමේ ප්‍රතිශතය ආයුර්වේද වෛද්‍ය උපාධිය සහ යුනානි වෛද්‍ය උපාධිය සඳහා පිළිවෙලින් සියයට 44 ක් සහ සියයට 35 ක් විය. | පාඨමාලාවේ ඇති සමහර අඩුපාඩු, ආයතනයේ හා ආයුර්වේද ශික්ෂණ රෝහලේ සම්පත් හිඟවීම, සිසුන් ප්‍රායෝගික කටයුතු වලට සහභාගී වීම අඩුවීම හා ශිෂ්‍යන්ගේ බාහිර කටයුතු මෙයට හේතු විය හැකි අතර පාඨමාලාවේ අවශ්‍ය සංශෝධන කර ඇති අතර මෙම තත්ත්වය අවම කර ගත හැකි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටින බව. | විභාග අසමත්වීම සම්බන්ධයෙන් නිරන්තර සමාලෝචනයට ලක්කරමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | පසුගිය වසර 7 තුළදී ආයතනයේ සිසුන් බඳවාගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් අනුව බඳවාගැනීමට පහසුකම් තිබුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 1,580 ක් වුවද මෙම කාල පරිච්ජේදයේදී බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 1,475 ක් පමණි. එය බඳවා ගැනීමට හැකියාව ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 93.4 කි. | සිසුන් බඳවා ගැනීමේදී ආයතනය විසින් කිසිදු අඩු කිරීමක් සිදු කර නොමැත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එවන ලද නාමලේඛණය අනුව ලියාපදිංචි කරනු ලබන අතර ලියාපදිංචි නොවූ නාමලේඛණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවනු ලැබේ. ඒ අනුව නව නාමලේඛණය එවනු ලබන අතර ඒ අනුව ලියාපදිංචි කරනු ලබයි. මේ ආකාරයට කිහිප වතාවක් ලියාපදිංචි කිරීම සිදු කරනු ලබන අතර සමහර ශිෂ්‍යයන් ලියාපදිංචි නොවීම මත මෙම තත්ත්වය ඇතිව තිබේ. එය ආයතනයේ පාලනයකින් තොර තත්වයක් බව. | විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් උපරිමව උපයෝජනය කළ යුතුය. |

**4.3 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යායපත්‍රය“ පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණ නමුත් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ,ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි . | විගණනය විසින් පෙන්වා ඇති අඩුපාඩු හඳුනාගෙන තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සංධිස්ථාන හා ඉලක්ක මැන බැලීම සඳහා වූ දර්ශකයන් හඳුනා ගැනීමට 2019 වර්ෂයේ දී කටයුතු කරනු ලබන බව. | දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |